# වාෂ්ප එංජිමේ සිට ජෙට් එංජිම දක්වා ඇතිවූ දියුණුව

## වාෂ්ප ජංගමනය 1804




ගල් අඟුරු උෂ්මකය මගින් ජලය තාපාංකය දක්වා රත් කෙරේ. නික්මෙන වාෂ්පය මගින් පිස්ටනය ක්‍රියාකරවන අතර ඒ හරහා ජවරෝදය කැරකැවේ.

වැල්ව පද්ධතිය






1804 දී ට්‍රෙවිතික් පළමු වාෂ්ප ඇංජිම රේල්පීලි මත ධාවනය කරවිය. ඊට පැයට කි. මී. 8 ක වේගයක් තිබිණි. පසුව ස්ටීවින්සන් ගේ රොකට්ටුව නම් එංජිම හඳුන්වාදීමත් සමග ම මෙය අභාවයට ගියේ ය.

## විද්‍යුත් මෝටරය - 1825

1825 දි මයිකල් පැරඩේ ඩයිනමෝව නිපදවී ය. එය නූතන විද්‍යුත් මෝටරවල ආරම්භය විය.



සෙල්ලම් රොබෝව

විද්‍යුත් ධාරාව වයර් හරහා ගලාගිය අතර එමගින් ආමේචරය, චුම්භකයක් බවට පත් කෙරිණි.




චුම්බක ධ්‍රැව අතර සිදුවන විකර්ෂණය හේතුකොටගෙන ආමේචරය භ්‍රමණය වේ. න්‍යාදේශකය (කොමියුටේටරය) හා ඇතිල්ල අතර සබඳතාව නැතිව ගොස් පරිපථය බිඳ වැටේ




ආමේචරය අර්ධ ලෙස භ්‍රමණය වූ විට බැටරිය සමග ස්පර්ශවී එය චුම්භකිත කරයි. මෙවිට ධ්‍රැවියතාව වෙනස් වේ.






## ඔටෝමොබයිල් ඕස්ට්‍රියා 1831




පිස්ටනය පහළට යත්ම ඉන්ධන/වායු මිශ්‍රණය දහන කුටීරයට යයි. කපාට වැසේ. පිස්ටන විවර වී මිශ්‍රණය පීඩනයට ලක් වේ. ඉන්ධන දහනය මගින් ඇතිවන පිළිගුම නිසා පිස්ටනය පහළට එයි. පිටකුරු කපාටය විවරවී පිස්ටනය හරහා දැවුණු ඉන්ධන පිට වේ.

ප්‍රේරණය, සම්පීඩනය, බලය, පිටවීම





බෙන්ස් ත්‍රිවිලරය

1831 දී මාකස් පෙට්‍රල් මගින් ධාවනය වන මෝටර්රථය නිපදවූවේ ය. එහෙත් මේ පෙට්‍රල් වාහන සෙෂ්ත්‍රයේ පුරෝගාමීන් ලෙස සැලකෙන්නේ ඒවා අලෙවි කිරීමට කටයුතු කළ (1885) ඩෙයිම්ලර් හා බෙන්ස් ය.

## රොකට් මෝටරය - ජර්මනිය 1928

1928 දී ස්ටේමර් තිසර්පණයක් (ග්ලයිඩරයක්) වැඩි දියුණු කොට එය රොකට් මෝටරයකට සම්බන්ධ කොට අහසේ පියාසර කළේ ය. මෙය පළමු ප්‍රචාලන රොකටය නිපදවීමේ මුල් පියවර විය. මුල් ප්‍රචාලන රොකටය වන මෙසෙස්මිට් 163 කොමට් නිපදවුණේ 1941 දී ය.



මෙසෙස්මිට්

ද්‍රව ඔක්සිජන් හා හයිඩ්‍රජන් දහන කුටීරයේ දී මිශ්‍රවූ අතර එමගින් ඇතිවන පිපුරුම තොසලයට තෙරපුමක් ලබාදුනි.




## ජෙට් එංජිම 1939




වාතය සම්පීඩකය තුළින් දහන කුටීරයට යයි. එහි දී ඉන්ධන දහනය වේ. පිටවන වායු මගින් ඇතිවන තෙරපුම නිසා තලබමරයේ තල කැරකේ. මෙමගින් වාතය උරාගැනේ.

සම්පීඩකය




1936 - වොන් ඔහයින් රාත්තල් 1100 ටර්බොජෙට් එංජිමක් නිපදවිය. එය හෙයින්කල් 178 ගුවන්යානය සඳහා යොදා ගැනිණි.






1712 - නිව්කොමන් නව වාෂ්ප එංජිම නිපදවීම

1804 - ට්‍රෙවිතික් වාෂ්ප ජංගමනය නිපදවීම

1821 - පැරඩේ විද්‍යුත් බලය සොයාගැනීම හා එය සංවරණ කටයුතු සඳහා යෙදවිය හැකිබව පෙන්වීම

1824 - කාර්නොට් තාපය ජංගමනය කෙරේ බලපාන අයුරු සොයාගැනීම

1831 - හෙන්රි ප්‍රථම ප්‍රායෝගික විද්‍යුත් මෝටරය නිපදවීම

1860 - ලෙනොයර් ගෑස් දහන එංජිම නිපදවීම

1876 - ඔටෝ සිව්පහර (Four Stroke) ගෑස් දහන එංජිම නිපදවීම

1885 - බෙන්ස් ගෑසොලින්වලින් ධාවන ප්‍රථම මෝටර් රථය නිපදවීම

1926 - ගොඩාඩ් ද්‍රව ඉන්ධන රොකටය නිපදවීම

1930 - විට්ල් ප්‍රථම ජෙට් එංජිම නිර්මාණය කිරීම

1942 - වොන් බ්‍රවුන් ප්‍රථම නිසර්පණ මිසයිලය (V2) නිර්මාණය

1957 - රුසියාව ප්‍රථම චන්ද්‍රිකාව කක්ෂයට යැවීමත් සමගම අභ්‍යාවකාශ යුගය ඇරඹීම